# ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

## රැකියා ඇබෑර්තු

# තාක්ෂණ නිලධාරී (ICT), III ශ්‍රේණිය

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් ඉහත තනතුර සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් 25.05.2021 දක්වා අයදුම්පත් ලබා ගැනේ.

**සුදුසුකම් :**

1. ඕනෑම විෂය ධාරාවකින් එකවරකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් තුනකින් (3) සමත්වී තිබිය යුතුය

සහ

2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ පිළිගත් ආයතනයක් විසින් අනුමත තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය/තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය/තොරතුරු හෝ සමාන ක්ෂේත්‍රයක NVQ මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා ගෙන තිබීම.

- තොරතුරු සහ සන්නිවේදන ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද ඇති අයවලුන් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් හිමිවනු ඇත.

**වැටුප් පරිමාණ** : U-MT 1(IIIA) - Rs. 31,625 - 7X300; 10X355 -37,275 p.m.

**තෝරාගැනීමේ ක්‍රමවේදය** : ලිඛිත සහ/හෝ ප්‍රයෝගික පරීක්ෂණයකින් සහ සම්මුඛ පරීක්ෂණයකින්.

**වයස** : වයස අවුරුදු18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**සටහන** : රජයේ දෙපාර්තමේන්තු/රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**ප්‍රතිලාභ**

- තෝරාගත් අයදුම්කරුවන්ගේ මාසික වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරන අතර, විශ්වවිද්‍යාලය විසින් 15% ක දායකත්වයක්, වැටුපෙන් 8% ක කොටසක් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලට සහ 7% ක කොටසක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ලෙස දායකත්වය කරනු ලැබේ. තවද ඔවුන් සේවක භාරකාර අරමුදලේ සාමාජිකත්වය දරණ අතර, ඒ සඳහා විශ්වවිද්‍යාලය විසින් මාසික වැටුපෙන් 3% ක කොටසක් සේවක භාරකාර අරමුදල වෙනුවෙන් දායකත්වයක් දරනු ලැබේ.

**අයදුම්පත් සහ විස්තර**

අයදුම්පත් , අවශ්‍ය සුදුසුකම් සහ අනෙකුත් විස්තර www.seu.ac.lk යන විශවවිද්‍යාල වෙබ් අඩවියෙන් ලබා ගත හැක. උනන්දුවක් දක්වන අයදුම්කරුවන් අයදුම්පතක් සඳහා රු 200 මුදලක් ගෙවීමෙන් විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කරගත හැක.

අයදුම්පත් ගාස්තු මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක් මගින් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ නමට මහජන බැංකුවේ අඩ්ඩාලච්චේන ශාඛාවේ 228-1001-9000-1704 දරණ ගිණුම් අංකයට බැර වෙන පරිදි ගෙවීම් සිදු කළ යුතුය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ සහතිකවල පිටපත් ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල උද්‍යානය, ඕලුවිල් # 32360 යන ලිපිනයට 25.05.2021 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. ඉල්ලුම් කරන ලද තනතුරේ නම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයින් වන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් හරහා තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.නමුත් අයදුම්පතේ ප්‍රගමණ පිටපතක් (Advance Copy) අයදුම් කරුවන්ට මූලිකව එවීමේ හැකියාව ඇත. කෙසේ වෙතත්, අදාළ ආයතනයේ ප්‍රධානියා හරහා අයදුම්පත් ඉදිරිපත්කර නොමැති නම්, එවැනි අයදුම්කරුවෙකු පත්වීම සඳහා සලකා බලනු නොලැබේ.

අසම්පූර්ණ සහ සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් හෝ අයදුම්පත් බාරගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අපේක්ෂකයින් තෝරා ගැනීමේ අවසන් කෙටි ලේඛනය සකස් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සතු වන අතර, සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන්නේ කෙටි ලේඛනයේ ලැයිස්තුගත අයදුම්කරුවන් පමණී..

**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය**
**විශ්වවිද්‍යාල උද්‍යානය, ඕලුවිල් # 32360**

20.04.2021